# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,522 — 2007 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා — 2007.11.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1231 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 නොවැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ඔක්තෝබර් මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## විභාගාපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

- i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
- ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
- iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
- vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිඳු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනය කිරීමයි

### ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවාගැනීමේ සීමිත තරඟ විභාගය –2007

අංක 1,513 දරන 2007.08.31 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රිකාවේ* I වන කොටස (IIඅ) ඡේදයෙහි පළ කරන ලද ඉහත දැන්වීමෙහි 07 ඡේදයෙහි (ආ) යටතේ දක්වා ඇති විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007 නොවැම්බර් මස 15 දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 17 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

11-212

---

## රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

### සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2007

සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයක් රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2008 ජනවාරි මාසයේ දී පමණ පවත්වනු ලබන අතර, පහත සඳහන් නිවේදනය අනුව ඒ සඳහා පුරුෂ පක්ෂයෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *අවශ්‍ය සුදුසුකම්*:- සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, ඒවා සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

*(අ)* ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
*(ආ)* අධ්‍යාපන සුදුසුකම් :

1. *බාහිර අයදුම්කරුවන් සඳහා :*

පිළිගත් විශ්ව විද්‍යාලයක පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිය ලබා තිබීම,

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු පෙළ සාමාර්ථයක් හෝ දෙවන පෙළ ඉහළ පන්තියේ සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව විෂයක් සහිතව විද්‍යාවේදී උපාධිය ලබා තිබීම,

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව විෂයක් සහිතව විද්‍යාවේදී උපාධිය සමග රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

රසායන විද්‍යා ආයතනයේ වරලත් සාමාජිකයෙකු වීම.

2. *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යා විෂයක් සහිතව විද්‍යාවේදී උපාධිය සමග පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිතව පුපුරණ ද්‍රව්‍ය පාලකගේ අධීක්ෂණය යටතේ පුපුරණ ද්‍රව්‍ය විෂය ක්ෂේත්‍රයේ අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා ඇති රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ සේවයේ නියුතු බලාත්මක නිලධාරියෙකු විය යුතුය.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන 2007.11.30 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයවලුන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරික සෞඛ්‍ය අතින් සුදුසුකම් තිබිය යුතුය. මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) පහත සඳහන් ලියකියවිලි නියම කළ විටක ඉදිරිපත් කිරීමට ද අපේක්ෂකයා සූදානම්ව සිටිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. උපාධි සහතිකය
3. චරිත සහතික දෙකක්
4. ඉංග්‍රීසි/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාගයේ සහතික

*සැ. යු*– ඉල්ලුම් පත්‍රය සමග මෙම කිසිදු ලියවිල්ලක් හෝ පිටපතක් හෝ (විභාග ගාස්තු ගෙවීමේ කුවිතාන්සි හැර) නොඇමිණිය යුතුය.

3. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක විය යුතුය.

ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් දැනට රාජ්‍ය සේවයේ නියුක්ත නොවේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වනු ඇත.

iii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් දැනට රාජ්‍ය සේවයේ නියුක්ත ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන අය වේ නම්, ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වනු ඇත.

iv. පරිවාස කාලය තුළ දී සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබා ගත යුතු අතර, පත්වීමේ, ස්ථිර කරනු ලැබීම වෙනත් කරුණු අතර නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම මත රඳාපවතිනු ඇත.

4. *වැටුප් හා දීමනා* : රා.ප.ච.ලේ. 6/2006 හි SL 1/2006 අනුව මාසික රු. 22,935 - 10x645-8x790-17x1050 රු. 53,555) තනතුරට පත්වී වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.)

5. මෙම තනතුරට බඳවා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II තනතුරේ නිලධාරීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් පහත සඳහන් විෂයන්ගෙන් සමත් විය යුතුය.

1. ආයතන සංග්‍රහය
2. මුදල් රෙගුලාසි
3. නීතිය
4. දෙවන භාෂාව - වාචික පරීක්ෂණය

තනතුරට පත් වී වසර 3ක් ඇතුළත මෙම කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

6. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* : I වැනි කොටසේ 11(අ) ඡේදය ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසි මෙම පත්වීම සඳහා අදාළ වන්නේ ය.

7. *ඉල්ලුම්පත්‍ර හා විභාග ගාස්තු :*

(අ) මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රුපියල් 300/- කි. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ආදායම් ශීර්ෂ 6 අනුශීර්ෂ 1-4 විෂය (4) ට බැර වන සේ කච්චේරියට හෝ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට හෝ මුදල් ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථිත පිටපතක් හා එවනු ලබන අයදුම්පතේ ඡායාස්ථිත පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

(ආ) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබූ විගස ඒ බැව් පුවත්පත් දැන්වීමක් මගින් අපේක්ෂකයන් හට දැන ගැනීමට සලස්වනු ඇත. විභාගයට නියමිත දිනට දින 07 කට වත් පෙර ප්‍රවේශපත් නොලද අපේක්ෂකයන් කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5, යන ලිපිනයට රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත පහත විස්තර දැනුම් දිය යුතුය.

1. විභාගයේ නම,
2. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම,
3. ලිපිනය,
4. ඉල්ලුම්පත්‍ර තැපැල් කළ දිනය, තැපැල් කාර්යාලය සහ ලියාපදිංචි අංකය.

8. *විභාගයට ඇතුළත්වීම*.- අපේක්ෂකයකු විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින දිනයේ අපේක්ෂකයා වෙත නිකුත් කර ඇති විභාග ප්‍රවේශ පත්‍රය තම අත්සන සහතික කරවාගෙන විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. විභාගය කොළඹ දී පැවැත්වෙන අතර, විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු, උපවේශන දීමනා ආදිය කිසිවක් කිසිවෙකුට හිමි නැත.

*සටහන*.– අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත්වීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9. *අයදුම් කළ යුතු පිළිවෙල :*

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව සෙන්ටිමීටර 21x29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත්‍ර සකස් කරගත යුතු ය. 01 සිට 08 දක්වා කොටස් 1 වැනි පිටුවට ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු ය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2007 නොවැම්බර් මස 30 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5, දරන ස්ථානයේ පිහිටි රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි "සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යන්න පැහැදිළිව ලිවිය යුතු ය.

(ඇ) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා/පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ද, නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අදාළ ආකෘතියට අනුකූල නොවන අසම්පූර්ණ එමෙන්ම ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. ඉල්ලුම්පත්‍ර තැපෑලේ දී නැතිවීම හා ප්‍රමාදවීම පිළිබඳ කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

(ඉ) අයදුම්පත්‍රයේ ශීර්ෂය (හෙඩිම) අදාළ පරිදි සිංහල/දෙමළ භාෂාවෙන් පමණක් නොව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතු ය.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව:*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගැනේ.

1. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රය.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු 3 කට මෑතදී නිකුත් කරන ලද)

11. *සාවද්‍ය තොරතුරු සැපයීම*.– මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුරු හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත විභාග අපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස් ද පිළිපැදිය යුතු ය.

12. *මාධ්‍යය* : මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත් වේ.

(අ) අපේක්ෂකයකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලද මාධ්‍යයෙන්ම මෙම විභාගයට පෙනී සිටිය යුතු ය.

(ආ) අපේක්ෂකයෙකු සියලු ම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
(ඇ) විභාගයේ දී මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොලැබේ.

13. *විභාග ක්‍රමය* : විෂයන් තුනකින් යුත් ලිඛිත පරීක්ෂණයකි :

(අ) කොටස :

1. අවබෝධය - පැය දෙකක ප්‍රශ්න පත්‍රයක් - ලකුණු 100 යි.
2. බුද්ධි පරීක්ෂණය - පැය එකක ප්‍රශ්න පත්‍රයක් - ලකුණු 100 යි.
3. ප්‍රායෝගික රසායන විද්‍යාව - පැය දෙකක ප්‍රශ්න පත්‍රයක් - ලකුණු 100 යි.

(ආ) කොටස :

(අ) කොටසේ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු එකතු කිරීමෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලැබීමට සුදුසුකම් ලබන ප්‍රමුඛතා ලේඛනය සකස් කරනු ඇත.

14. විෂය නිර්දේශය :

*විෂය අංක 01 -අවබෝධය.–* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. පළමු වැනි කොටසට රචනයක් සහ සාරාංශයක් ලිවීම ඇතුළත් වේ. භාෂාව භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨයන් කිහිපයකින් දෙවැනි කොටස සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගෙන් අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳව විවරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්පයන් කාණ්ඩයකින් ඉතාමත් උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා උත්තර කිහිපයක් අතරින් නිවැරදි උත්තරය තෝරා දක්වන ලෙස අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. (පැය 02ක ප්‍රශ්න පත්‍රයකි.)

*විෂය අංක 02 - බුද්ධි පරීක්ෂණය.–* අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය සහ නැවැරදිව සිද්ධි අනුමනයන්ට එළඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන සකස් කළ විෂයානුබද්ධ වාස්තවික ප්‍රශ්න ඇතුලත් (Objective Type) ප්‍රශ්න පත්‍රයකි. (පැය 01 ක ප්‍රශ්ණ පත්‍රයකි.)

*විෂය අංක 03 - ප්‍රායෝගික රසායන විද්‍යාව.–* මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම, ඛණිජ සම්පත් ව්‍යාප්තිය, ආර්ථික වර්ධනය සඳහා රසායන විද්‍යාත්මක පදනම, පුපුරණ ද්‍රව්‍ය සංයුතිය හා භාවිතය, පුපුරණ ද්‍රව්‍ය පනත හා කාලීන සංශෝධන පිළිබඳ අවබෝධය පරීක්සීම සඳහා ය. (පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.).

15. *තෝරා ගැනීමේ ක්‍රමය :*

(1) 1990.03.09 වන දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විවෘත තරග විභාගයේ දී ලබාගත් කුසලතාව මත බඳවා ගැනීම සිදු කෙරේ. කෙසේ වෙතත් නිශ්චිත සංඛ්‍යාව තීරණය කිරීමේ අපහසුතාවයන් පැන නගින්නේ නම්, 2%ක අඩු කිරීමක් හෝ එකතු කිරීමක් කරනු ලැබේ.

(2) තරග විභාගයෙන් තෝරාගත් අයගේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම පිණිස හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම පිණිස ද කැඳවීමක් කරනු ලැබේ. මෙහි දී ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද සියලු තොරතුරුවලට අදාළ ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු ය. මේ සඳහා ලකුණු දෙනු නොලැබේ.

16. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

17. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටලුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද, විභාගය මගින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලබන අතර, එය අවසන් තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී/ආර්එස්පී/පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

කොළඹ 03, අංක 15/5, බාලදක්ෂ මාවතේ,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

## සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007

## OPEN COMPETITIVE EXAMINATION FOR THE RECRUITMENT FOR THE POST OF ASSISTANT CONTROLLER OF EXPLOSIVES - 2007

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1. විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍ය :
(සිංහල -2, දෙමළ -3, ඉංග්‍රීසි - 4) (අදාළ කොටුව තුළ ලියන්න)

2. *ගැසට්* නිවේදනයට අනුව ඔබ බාහිර අයදුම්කරුවකු නම් -1 ද, අභ්‍යන්තර අයදුම්කරුවකු නම් - 2 ද, කොටුව තුළ යොදන්න

3. මුලකුරු අගට යොදා මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය : උදා: SILVA, A. B.)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය.)

6. විවාහක අවිවාහක බව :
(විවාහක-1, අවිවාහක -2) (අදාළ කොටුව තුළ ලියන්න)

7. ජනවර්ගය :
(සිංහල -1, දෙමළ -2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් -5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

8. (i.) ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :————.

| උපාධිය ඩිප්ලෝමාව | වර්ෂය | විෂයයන් | පන්තිය සාමාර්ථය | විශ්ව විද්‍යාලය/ ආයතනය |
|---|---|---|---|---|
| | | | | |

(ii) සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :

(අ) සිංහලෙන් :
(ආ) දෙමළෙන් :
(ඇ) ඉංග්‍රීසියෙන් :

9. (i) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(ii) වයස : අවුරුදු මාස දින

10. කරන ලද රැකියාවන් විස්තර : (අදාළ වේ නම්)

| දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම | දැරූ තනතුර | කාලය | | වාර්ෂික වැටුප |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

11. විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.

(i) අංකය :————.
(ii) දිනය :————.
(iii) නිකුත් කළ කාර්යාලය :————.

12. *පදිංචිය පිළිබඳ විස්තර :*

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (පදිංචි) :————.
(ii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :————.
(iii) දිස්ත්‍රික්කය සහ එහි පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

13. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුවත් විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................................................ මහතා මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු මා ඉදිරිපිටදී 200..................................... දින ඔහුගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :————.

————,
අත්සන සහතික කරන නිලධාරීගේ අත්සන.

අත්සන සහතික කරන නිලධාරීගේ සම්පූර්ණ නම :————.

ලිපිනය හා තනතුර :————.

(ඉල්ලුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ වර්ෂයකට රුපියල් 2,30,700 ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.)

15. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා) :

මෙම ඉල්ලුම්කරු වන........................................................................................ මහතා මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ සේවය කරයි. ඔහු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර...........................ක කාලය තුළ ඔහු වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, ඔහු මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත්කොට නොමැති බව ද, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බව ද, මින් සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ / බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.

11-193

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි ÷

| | රු. | ශ. |
|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අහලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | 1,008 | 0 |

(අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය*" පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ *ගැසට්* පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.***- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| නොවැම්බර් | 2007.11.02 | සිකුරාදා | 2007.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.09 | සිකුරාදා | 2007.10.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.16 | සිකුරාදා | 2007.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.23 | සිකුරාදා | 2007.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.30 | සිකුරාදා | 2007.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2007.12.07 | සිකුරාදා | 2007.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.14 | සිකුරාදා | 2007.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.20 | බ්‍රහස්පතින්දා | 2007.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.12.28 | සිකුරාදා | 2007.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2008** | | | |
| ජනවාරි | 2008.01.04 | සිකුරාදා | 2007.12.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2008.01.11 | සිකුරාදා | 2007.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.01.18 | සිකුරාදා | 2008.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.01.25 | සිකුරාදා | 2008.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.